වීර් යව්ටෝගේ
සහ
තෙයූන්ගේ කතන්දරය

වීර යට්මෝගේ
සහ
නෙයුන්ගේ කතන්දරය

අනුවාදය

දැදිගම වි. රැද්රිගු

Kanol

රුසියාවේ උතුරු පෙදෙසට ලංකාවට මෙන් හැමදාම හිරු නොපායයි. අවුරුද්දේ මාස කීපයක් ම හිරු නැති අඳුර එහි රජ කරයි. ඉතිරි කාලයේ හිරු නොබැස දිගටම පායයි. උතුරු පෙදෙසේ ජනයා වාසය කරන්නේ මුව හමින් සෑදූ කූඩාරම්වල ය. ඉස්සර කාලේ මේ පෙදෙස්වල විසූ ජනයා හිම කුණාටු ගුප්ත බලයක් ලෙසත්, මාස කීපයක් තිස්සේ පවතින සදා අඳුර මායාකාරී බලයක් ලෙසත් සැලකූහ. සොබා දහමේ මේ බලවේග පරාජය කරන වීරයින් පිළිබඳ ලස්සන කතන්දර ඔවුන් විසින් ගෙතිණි. රුසියාවේ උතුරු පෙදෙසේ වාසය කරන නෙන්ට්ස් ජන කතා අතරින් එකක් වූ යට්ටෝ සහ තෙයූන් පිළිබඳ මේ කතාව සකස් කරන ලද්දේ ජාන්නා විටෙන්සොන් විසිනි. චිත්‍ර ලියනීඩ් ආරිස්තොව්ගේ ය.



බොහොම ඉස්සර කාලේ සීතල වතුර ඇති මුහුදක් අසල මුව හමින් සෑදූ කූඩාරමක් තිබුණා. මේ කූඩාරමේ දුප්පත් අම්මා කෙනෙකුයි, පුතෙකුයි, දුවකුයි වාසය කළා. පුතාගෙ නම යට්ටෝ, දුවගේ නම තෙයූන්. අම්මා ගෙදර හැම වැඩක් ම කළා.

අම්මා සතුන් දඩයම් කළා. වතුර ගෙනාවා, දර කෝටු එකතු කළා. දවසක් දා අම්මා අසනීප වුණා. "යට්ටෝ, දර කෝටු අහුලාගෙන එන්න" කියලා අම්මා පුතාට කිව්වා. යට්ටෝ මුව හමෙන් මූණ වසාගෙන හොරට නිදා ගෙන හිටියා.

“අනේ දුවේ ගිහිල්ලා දර කෝටු ටිකක් ගේන්න” අම්මා තෙයූන්ට කිව්වා. හිස පීරලා, කොණ්ඩෙ ගොතලා, මුතු ඇටවලින් හිස සරසමින් හිටිය තෙයූන් වැඩට හොරයි. “මට බැහැ” කියලා ඈ කිව්වා. “හිම කුණාටුව කූඩාරම ඇතුළට ආවොත් මහ විනාශයක් වේවි” අම්මා පුතාටයි, දුවටයි කිව්වා.

හිම කුණාටුව අත ළඟටම ඇවිත්.... ගිනි පුපුරක් හිම කුණාටුව මත වැටුණා. හිම දියවෙලා සිදුරක් ඇති වුණා. නපුරු හිම කුණාටුව ගින්නට බයයි.

කූඩාරමේ ගිනි මැලය නිවී ගිය හැටියෙම මායාකාර නපුරු හිම කුණාටුව කූඩාරම ඇතුළට ඇවිත් අම්මාට පහරක් ගැසුවා. අම්මා අතක් ඉස්සුවා, එවිට ඒ අත කුරුල්ලෙකුගේ පියාපතක් බවට පත් වුණා. අනිත් අතත් පියාපතක් වුණා.

අම්මා සුදුපාට වටුවෙක් වුණා. නපුරු හිම කුමාරිව පුතාටයි, දුවටයි පහර දීමට ආවා. එවිට වටුවා පියාපත්වලින් ඔවුන් ආරක්ෂා කළා. පුතාටයි, දුවටයි පහර දීමට කුමාරිවට බැරි වුණා.

හිම කුණාටුවට අසුවුණු වටුවා පියාඹන්නට පටන් ගත්තා. යට්ටෝ සහ තෙයූන් කුණාටුව පස්සේ දුවන්නට පටන් ගත්තා. හිම කුණාටුව අතින් අල්ලා ගන්න පුළුවන් ද! “අයියා තමයි වැරදිකාරයා” නංගී කිව්වා. “නැහැ. නංගී තමයි වැරදිකාරි” අයියා කිව්වා.

දැන් ඉතින් වාද කිරීමෙන් වැඩක් නැහැ නේද! ඇඳිරි කූඩාරම තුළ අයියයි නංගියි රැය ගත කළා. උදෙන්ම නැගිට සිටි යට්ටෝ දුන්නයි, ඊ තලයි අරගෙන නංගීට කතා කළා. "තෙයූන් අම්මා හොයන්ට යමු!"

හිම කුමාරිය වටුවාව තමාගේ හිම කූඩාරම තුළට ගෙනැවිත්, තම අත ඇති පොල්ලෙන් බිමට පහරක් ගැසුවා. එවිට වටුවා නැවත ගැහැනියක් බවට පත් වුණා. ගින්නට අසුවෙලා පිළිස්සුණු හිම කබාය වෙනුවට අලුත් හිම කබායක් මහන ලෙස හිම කුමාරිය යට්ටෝගේ අම්මාට අණ කළා.

හිම නූල්, හිම ඉඳිකටු හන්දා ඇගේ අත් සහ ඇඟිලි ගල් ගැහුණා. අම්මා තමාගේ ළමයින් සහ කූඩාරම ගැන සිතන්නට වුණා. ළමයින්ට මෙනවා වුණා ද? යට්ටෝ සහ තෙයූන් තම කූඩාරමෙන් පිට වී ගොස් අම්මා සොයන්නට පටන් ගත්තා.

ඉර මේ දෙදෙනාට මඟ පෙන්නුවා. "හිම කුණාටුව ජීවත් වෙන්නෙ හිම කඳුවල. එහි යාම බොහොම අවදානම්. ගිනි පිටකරන ඊතල මම නුඹලාට දෙන්නම්. ඒවා නුඹලාට පිහිට වේවි" කියලා ඉර කිව්වා.

දිලිසෙන ඊතල දෙකක් යට්ටෝගේ පාමුල වැටුණා. ඉර දුන් ඊ දෙක මුවහමින් ඔතලා යට්ටෝ ඒවා කබාය යට සඟවා ගත්තා. ඉර බැස ගියා. ඉන් පසු මාස කීපයක් තිස්සේම ඉර නොපායන අඳුරු රැය ඇති වුණා.

අඳුරේ සිට මුව පැටියෙක් සහ වෘකයෙක් දුවගෙන ආවා. යට්ටෝ එක ඊයක් විදලා වෘකයාව මරා දමලා මුවාව බේරා ගත්තා. උගත් අම්මා නැති මුව පැටියෙක්.

හිම කුණාටුව මහා කම්මැලියාව එව්වා. ඔහු ආවේ ළමයින්ව නිදි කම්මැලියන් බවට පත් කරලා නිදි කරවන්නයි. තෙයූන් මායාකාර නළාවක් පිඹලා මහා කම්මැලියාව නිදි කෙරෙව්වා. ඔහු තුන්ද්‍රා වනයේ නිදා ගත්තා.

අයියයි, නංගියි, මුව පැටියයි ගමනට පිටත් වුණා. එවිට මුව දෙන පැටියාව හොයමින් ඔවුන් ළඟට ආවා. මුව දෙන පැටියා දැකලා බොහොම සතුටු වුණා. මුව දෙන යට්ටෝවයි, තෙයූන්වයි පිට උඩ තබාගෙන තුන්ද්‍රා මහා වනය මැදින් එක පිම්මට දුව ගියා....

...හිම කඳුවලට මේ දෙදෙනා ආවා. හිම කුණාටුවට අයත් හිම කූඩාරම තියෙන්නේ කඳු මුදුනේ. කූඩාරම ඇතුළෙ හිම බිත්තියක් තියෙනවා. එතැන තමයි යට්ටෝගේ සහ තෙයූන්ගේ අම්මා ඉන්නේ. කූඩාරම ඉදිරිපිට ගැඹුරු වළක්.

තෙයුන් තමාගේ කොණ්ඩය කපලා දිග කඹයක් ගෙතුවා. තෙයූන්ගේ කොණ්ඩය තරම් දිගැති, ලස්සන කෙස් වැටියක් ඒ රටේ වෙන කාටවත් තිබුණේ නැහැ. යට්ටෝ කඹය වළෙන් එපිට වීසි කරලා ලනු පාලමක් හැදුවා.



හිම කුමාරිකාව එවිට මහා අඳුර එවලා ළමයින් බිය කළා. හැම දෙයක් ම අඳුර හන්දා නොපෙනී ගියා. යට්ටෝ ඉර තෑගි දුන් ගිනි පිටකරන ඊයක් අඳුරු අහසට විද්දා. කළු පාට අහසේ අඳුර නැති වී, ඉර සහ උතුරු දිග ආලෝකය ඇති වුණා. අඳුර පැරදුනා.

අයියයි, නංගියි කඹය දිගේ ගිහිල්ලා වලෙන් එගොඩ වුණා. "මැරුම් නොකා පලයල්ලා!" කියලා හිම කුණාටුව ළමයින් බය කළා. යට්ටෝ ඉර තෑගි දුන් දෙවැනි ඊය හිම කුණාටුවට විද්දා. ඊය ගිනි පිට කරමින් හිම කුණාටුවේ හිම කැට් දිය කළා.

අම්මා පුතාවයි, දුවවයි බදාගෙන සිප ගත්තා. "පුතේ නුඹ නියම දඩයක්කාරයෙක්. අනේ දුවේ! නුඹේ ලස්සන කොණ්ඩෙට මක් වුණා ද?" අම්මා තෙයූන්ගෙන් ඇසුවා. "කමක් නැහැ, අම්මේ, කල් යන කොට ආයෙමත් වැඩේවි" තෙයූන් කිව්වා. යට්ටෝ සහ තෙයූන් අම්මාත් සමග ගෙදර ගිහිල්ලා බොහොම සතුටින් වාසය කළා.























Kanol Publishing House
1196/4, Kottawa Road, Pannipitiya
Tel: 011 4336778, 011 4336779

ISBN 978-955-1979-16-4
Rs. 150/-
9 789551 979164